Living the Lotus 11

Buddhism in Everyday Life

2025
VOL. 242

Overseas Members Cheerfully Participate in the 2025 Oeshiki-Ichijo Festival in Tokyo

Living the Lotus
Vol. 242 (November 2025)

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.
වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජිවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වර්ධනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

සියලු දෙනා එක්ව සාමය උදාකරගනිමු ①
බේදීම සහ සමගිය

නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

මේ පෘථිවිය හැර, යාමට තැනක් නොමැති අපි

මේ මාසයේ ජන්ම සංවත්සරය සමරන නිර්මාතෘ තුමා, සංවිධානය ආරම්භ කල දින සිට නිරතුරුව මනුෂ්‍ය වර්ගයා අතර සමගිය සහ ලෝක සාමය ප්‍රාර්ථනා කලා. මා හා සමාන වයසක එනම් අවුරුදු 88 කාලයේදී එතුමන් 'තමන්ගේ පැවැත්මම අන් අයට සහනයක් ලබා දෙන ජීවිතයක් කර දීමට කැමතියි' ලෙස තම අභිලාෂය පවසා සිටියා.

නමුත්, අපි සැම යුගයකම තම අභිමතය පරිදි දේවල් සිදු නොවන විට අතෘප්තියට පත් වනවා සේම, තමන්ට විරුද්ධ වන අයට වෛර කරයි. තම වාසිය තකා සමගිය පිළිබඳ තැකීමක් නොකර අන් අයව පරාජය කිරීමටත් රටවල් සහ සමාජ බේදීමට පවා කැමැත්තක් දක්වන පුද්ගලයන් සිටී. විශේෂයෙන්ම දසත විහිදී පැතිරී ඇති වර්තමාන ලෝක ස්වභාවය දෙස බලන විට, මිනිසුන්ට වැදගත් දේවල් අමතක වී ඇති බව හැඟී යයි.

ඒ අතරින් පළමු වැදගත් දෙය වන්නේ, අප සියලු දෙනාම සැම සියළු දෙයකම ආශිර්වාදයෙන් මේ ජීවිතය ගත කරනවා යන මූලධර්මයයි.

මේ විශ්වය ගැන දැනගත් පුද්ගලයන්ට නැවත කිසිද පෙර සිටි පුද්ගලයා බවට පත්විය නොහැක' ලෙස, මම ද දේශනයකට සවන් දී ඇති ෂ්වෙයිකාර්ට් නම් පෙර සිටි ඇමෙරිකානු ගගනගාමියෙකු පවසා ඇත. ජපන් ගගනගාමිවරියක් වන නඔකො යමසකි මහත්මිය මෙය සනාථ කරමින්, ඇය අභ්‍යවකාශයේ සිට දුටු පෘථිවියේ සුන්දරත්වය සහ නැවත පෘථිවියට පැමිණි විට පෘථිවිය කෙරෙහි ඇති වූ ආදරය සමඟ 'මේ පෘථිවියේ සැම දෙයක්ම විවිධ තුලනයන් මඟින් සමානාත්මතාව පවත්වාගෙන යනු ලබයි' ලෙස ඇයගේ අත්දැකීම් පවසා තිබුනි. 'එමනිසා මිනිසුන් එකිනෙකා සමඟ ගැටුම් ඇතිකර ගැනීම ඉතාම කණගාටුදායකයි, මන්ද අභ්‍යාවකාශයේ සිට බලන විට පෘථිවිය එකම ලෝකයක් පමණක්ම වන නිසා' ලෙස 2016 ජනවාරි මස 27 දින චූගයි නිප්පෝ පුවත්පතෙහි සඳහන් විය.

ෂිරා නම් ඇමෙරිකාවේ පළමු ගගනගාමියා 'මම තුන් වතාවක් පෘථිවිය හැරද ගගනගත වුවද, මට පෘථිවිය හැර, යාමට වෙනත් ස්ථානයක් නොතිබුණි. කරුණාකර පෘථිවි ලෝකයට ආදරයෙන් සලකන්න' ලෙස අප වර්තමානයේ දැනුවත් විය යුතු වැදගත් දෙයක් පෙන්වා දී ඇත. අප එකිනෙකාට හානි කරගනිමින් සමගිය බිඳ දැමුවහොත් එය සාමය සහ ගෝලීය පරිසරය විනාශ කරමින් මනුෂ්‍යත්වයේ ස්වයං විනාශයට මග පාදනු ඇත.

තමාව, තමාට ආලෝකයක් කරගෙන වගේම ධර්මය තමාට ආලෝකයක් කරගෙන

ලොව පුරා සිටින නායකයන්ට අභ්‍යවකාශයේ සිට පෙනෙන පෘථිවියේ ඡායාරූප යවා, අපගේ ජීවිත පැමිණෙන්නේ කොතැනක සිටද, අප කුමන ආරක්ෂාවක් යටතේ ජීවත් වන්නේද යන්න පිළිබඳව ඔවුන්ව දැනුවත් කළ හැකිනම්, ‘මෙය යුද්ධ කිරීමට කාලයක් නොවේ’ ලෙස කල්පනා කරන පුද්ගලයන් සිටියි යනුවෙන් සිතීම ශුභවාදී වේදැයි නොදනිමි. කෙසේ වුවද, බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරන අප පෘථිවියේ වැදගත්කම පමණක් නොව, ගැටුම් සහ බේදීම් ප්‍රතික්ෂේප කර සමගිය ඇති කරවන ඉගැන්වීම්ද දැනටමත් අවබෝධ කරගෙන තිබේ.

සියලු සංසිද්ධීන් වෙනස් වීමට (අනිත්‍ය) යටත් වන අතර, සියලු දේ සහ සම්බන්ධතා හරහා ඇතිවී එය අන්තර් යැපීමේ සබඳතා (අනාත්ම) මත පදනම් වේ. මෙම සත්‍යය වටහාගෙන අපට ලැබී ඇති ජීවිතයේ ආශ්චර්යය සහ කෘතඥතාවයෙන් අප අවදි වුවහොත්, ද්වේෂයේ සහ රාගයේ ගිනිදැල් නොදැවෙන (නිවන) අපට අවබෝධ වනු ඇත. නිර්මාතෘ තුමා මෙම නිර්වාණයට නිශ්චිත ප්‍රකාශයක් ලෙස ‘අප එකිනෙකාට ආදරය කරමින්, එකිනෙකා ගැන සැලකිලිමත් වෙමින්, පසුගාමීන්ගේ අත් අල්ලාගෙන, ශක්තිය නොමැති අයට ශක්තිය ලබා දෙමින් සමබරව එක්ව ගමන් කරමු. සියලු මනුෂ්‍ය වර්ගයාට මේ ආකාරයෙන් ජීවත් විය හැකි නම්, නිර්මාණශීලීත්වයෙන් සහ ප්‍රගතියෙන් පිරි සජීවී ජීවිතයක් අත්විඳිය හැකි අතර, ඒ සමගම අපට විශාල සාමයක් අත්විඳිය හැක’ ලෙස සටහන් කර ඇත. මේ ආකාරයට ප්‍රාර්ථනා කරමින් තමාව, තමාට ආලෝකයක් කරගෙන වගේම ධර්මය තමාට ආලෝකයක් කරගෙන අප වටා අපහසුතාවයට පත්ව සිටින පුද්ගලයන්ට උපකාර කිරීම ඔවුන් සමඟ කතා කිරීම අපි සිදු කරමු. විශේෂයෙන්ම අපට සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන්ගේ වේදනාත්මක තත්වය පිළිබඳව අනුකම්පා කර අපට කළ හැකි දේ අපි කරමු. මෙය සන්සුන් ලෝකයක් සඳහා වෙහෙසෙන සෑම පුද්ගලයෙකුගේම ‘සාම ක්‍රියාවලිය’ ලෙස පැවසිය හැකිය.

නිර්මාතෘවරයා විසින් තවදුරටත් ‘තම කාමරයේ අන්ධකාරය ගැන පැමිණිලි කිරීමට පෙර තමන් විසින්ම කවුළුව විවෘත නොකරන්නේ මන්ද’ ලෙස ද පවසා ඇත. ‘ශාක්‍යමුණි බුදුන් වහන්සේගේ ඉගැන්වීම්වලට සවන් දී ඇති අප මිනිසුන්ගේ හදවත් විවෘත කිරීමට මූලිකත්වය ගත යුතු නොවේද. අපි අවිද්‍යා අන්ධකාරයේ බුදුන්ගේ ඉගැන්වීම් නැමති පහන දල්වා තබමු’. මෙම වචන වර්තමානයේ තරම් ප්‍රබල ලෙස කිසිදු අනුනාද වී නොමැතිද.

කෝසෙයි, 2025 නොවැම්බර් කලාපය ඇසුරිණි

නම්‍යශීලී හදවතින් මේ මොහොතේ උපරිම කැපවීමෙන් ජීවත් වීමට

ඉම් සුජුන් මහත්මිය, කොරියානු ධර්ම ශාඛාව

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූයේ කවදද, කුමන හේතුවක් නිසාද?

මම 2001 අවුරුද්දේ අප්‍රේල් මාසයේදී, රිෂ්ෂෝ කෝසෙයිකායි සාමාජිකයෙකු වූ මගේ නැනාගේ (ඕ ජුන්සොක් ධර්ම නායිකාවක්) හඳුන්වාදීමකට අනුව සාමාජිකත්වය ලබා ගත්තා. එවකට පෙරපාසල් වයසේ පසු වූ මගේ දරුවන් දෙදෙනා හොඳ දරුවන් ලෙස පෝෂණය කිරීමට මා තුල වූ අරමුණ, සාමාජිකත්වය ලබාගැනීමට හේතුවක් වූවා. මගේ ළමුන් ටිකක් දඩබ්බර වූ අතර කොතැනක සිටියත් ඔවුන්ගේ ක්‍රියාවන් අන් අයගේ

ඉම් සුජුන් සාන්

විවේචනයන්ට ලක්වූවා. මගේ නැනාට තරුණ වියේ දරුවන් දෙදෙනෙකු සිටි අතර, ඔවුන් ඉතා කීකරු, මෘදු හදවත් ඇති සහ බුද්ධිමත් දරුවන් වූවා. මා හොඳින්ම ඒ ගැන දැනුවත් වූ බැවින්, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වුවහොත් මගේ දරුවන්ද එලෙස ඇති දැඩි කල හැකියැයි මා සිතුවා.

සම්බන්ධ වීමෙන් පසු, පවුල් අධ්‍යාපනය ඉගෙනීම ඇතුළු හෝසාවන්ට සහභාගී වීම, සූත්‍ර සජ්ජායනය කිරීම සහ තෙදොරි මිච්බිකි කල අතර, පවුල තුල කරුණු තුනක් ප්‍රායෝගිකව පුහුණු කිරීමට පටන්ගත්තා. (1.උදෑසන සුභපැතුම් තමා ප්‍රථමයෙන්, 2.තම නමින් කතා කලවිට 'ඔව්' යනුවෙන් ප්‍රති පිළිතුරු දීම, 3.පාවහන් පිළිවෙලට තැබීම සහ භාවිතා කල දෑ නැවත් නිසිලෙස තැබීම) වර්තමානය වන විට ධර්ම නායකයෙකු ලෙස එදිනෙද ධර්ම පුහුණුව සිදු කරනවා.

මේ අවුරුද්දේ අගෝස්තු මාසයේදී මූලස්ථානයේ පැවති නැගෙනහිර ආසියානු නායකත්ව පුහුණු වැඩසටහනට සම්බන්ධ වීමට ලැබීම ගැන ඔබගේ අදහස් සහ ඉන් ඉගෙනගත් විශේෂම කරුණ කුමක්ද?

මම දීර්ඝ කාලයක්, සැමියා සූදුවට ඇබ්බැහිව සිටි නිසා ආර්ථික වශයෙන් විශාල පසුබෑමකට ලක්ව සිටි අතර, මේ වන තෙක් ලීසකො කියෝකයිචෝ සාන් සහ උපදේශක ලී කියෝකෝ (කොරියාවේ කලින් කියෝකයිචෝ) යන දෙදෙනාගෙන් නිතරම උපදෙස් ලබා ගත්තා. උපදේශයන් ලබාගත් නමුත්, 'මේ කාරණය නිසා මේක කරන්න බෑ' සහ 'මේකත් මේ හේතුව නිසා කරන්න බෑ' යැයි නිදහසට කරුණු කියමින් කිසිවක් ක්‍රියාත්මක කලේ නෑ. දැන් ඒ දෙස නැවත හැරී බලන විට, ඒ වෙලාවේ ලැබුණු උපදෙස් අවංක හදවතින් පිළිගෙන ක්‍රියාවට නැංවූවානම් දීර්ඝ කාලයක් පැවතුණු ගැටලු ඉක්මනින් විසඳගන්න තිබුණා යැයි දැන් සිතෙනවා. මෙවර ලී කියෝකයිචෝ සාන්ගෙන්, 'මූලස්ථානයේ පවත්වන නැගෙනහිර ආසියානු නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගී වනවාද' කියා ආරාධනාවක් ලැබුණා. ඒ වෙලාවේ අරක මේක කියා නොසිතා අවංක හැඟීමෙන් 'ඔව්' කියා පිළිතුරු ලබා දුන් අතර වැඩසටහනට සහභාගී වූවා.

නැගෙනහිර ආසියානු නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගී වීමෙන් පසුව, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සහ හෝසා හි වැදගත්කම ගැන මම ඉගෙන ගත් අතර, ධර්ම ශාඛා පුහුණුව තුලින් විශේෂිත කරුණු දෙකක් ඉගෙන ගත්තා. ඉන් එකක්නම්, පුහුණුව සඳහා ගිය පවුලේ සාමාජිකයෙකුගෙන් මුතුන් මිත්ත්න්ගෙන් පැවතගෙන එන 'අපේ ජීවිතයේ' වටිනාකම සහ එහි ආශිර්වාදය ගැන අසන්නට ලැබුණු අතර, මුතුන් මිත්තන්ට පිංපෙත් පැමිණවීමට සහ කෘතවේදී වීමට නම් ඒ වෙනුවෙන් සූත්‍ර සජ්ජාය කිරීම වැදගත් යැයි ඉගෙන ගත්තා. කොරියාවේ කොන්ෆියුෂියානු ඉගැන්වීම් වලට අනුව, මුතුන් මිත්තන්ට ගරුකිරීම කෘතවේදී වීම දෙමාපියන්ට සලකන හොඳ දරුවකු වීමෙ වැදගත්කම උගන්වනවා. කෙසේ නමුත්, මම කලින් කියූ කතාවට සවන්දෙන විට, 'මම කෙදිනක හෝ මගේ මුතුන් මිත්තන්ට සැබැවින්ම කෘතඥතාව පලකර තිබෙනවාද? ඒ හා සමාන ක්‍රියාවන් කර තිබෙනනවාද? යන්න මම මගෙන්ම අසා සිටියා.

දෙවන කරුණ නම් විශේෂිතයි, මට හමු වූ සාමාජික පුද්ගලයාත් මම මෙන්ම, වයස අවුරුදු 90 ව ඉක්මවූ තම නැන්දම්මාව රැකබලාගන්නා අයෙකු වූවා. එදින මම, නැන්දම්මාව ආදරයෙන් රැකබලා ගැනීමේ හැඟීමෙන් මම කටයුතු කරන නමුත්, සමහර වෙලාවන්ට ඇයගේ ක්‍රියාවන් නිසා 'හැකි උපරිමයෙන් රැකබලාගන්නා නමුත්, ඇයි එහෙම කතාකරන්නේ' කියන මගේ හැගිම් ගැන සාමාජික පුද්ගලයාට අවංකව පැවසූවා. එවිට ඇය 'එහෙම දැණුනට කමක්නෑ. නමුත්, කිසිදිනෙක තමන් තමන්ට දොස් පවරා ගන්න එපා සහ ඔබේ කැපවීම ගැන ඔබටම ප්‍රසංසා කරගන්න' යනුවෙන් කාරුණිකව ප වසමින් මට සැහැල්ලු බවක් ගෙන දුන්නා. එම වටිනා උපදෙස් අසා, අන් අය රැකබලා ගැනීමෙන් වෙහෙසට පත්ව සිටින මම වගේම තවත් අයෙකුට 'ඔබ සිටිනා ආකාරය කමක්නෑ, ඒ ගැන වදනොවන්න තමන්ට දොස් පවරා නොගන්න' යැයි පවසමින් කරුණාවෙන් අන් අයව සැහැල්ලු කල හැකි පුද්ගලයෙකු වීමට මම අධිෂ්ඨාන කරගත්තා.

නැගෙනහිර ආසියානු පුහුණු වැඩසටහනේදී පැවැත්වූ හෝසා සහ ප්‍රායෝගික පුහුණුව පිළිබඳ දේශන තුලින් වඩාත්ම ඔබ සිත්ගත් කරුණ කුමක්ද?

ධර්ම ශාඛාවේදී එහි වැඩසටහන් අතරතුරදී, වැඩසටහයේ නායකයෙකු ලෙස හෝසාවටයක නායකත්වය ගෙන හෝසා වටයක් මෙහෙයවීමට අවස්ථාව ලැබුණා. නමුත් ඒ වන තෙක් මට එම අත්දැකීමක් නොතිබුණු

නිර්මාතෘ අනුස්මරණය වෙනුවෙන් සවස් කාලයේ පැවැත්වූ සූත්‍ර සජ්ජායනයෙන් අනතුරුව සාමාජිකයින් ඉදිරියේ තම හැඟීම් ප්‍රකාශ කරන ඉම් සාන්.
2024 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 04 වන දින
කොරියානු ධර්ම ශාඛාවේදි

නිසාවෙන් ලැබුණු වගකීමේ බරපතලකම ගැන සිතා මට තරමක පීඩනයක් දැනුණා. එයට හේතුව, 'සාමාජිකයින් බොහෝ උනන්දුවෙන් ධර්ම ශාඛාවට පැමිණ සිටින නිසාවෙන්, ඔවුනට ප්‍රයෝජනවත් උපදෙසක් ලබා දියයුතුයි, ඔවුන්ගේ දුක් වේදනාවන්ට නිසි මගපෙන්වීමක් ලබා දියයුතුයි' යැයි බැරෑරුම්ව සිතපු නිසා. නමුත්, පුහුණු වැඩසයහන මෙහෙයවපු ජපන් ජාතික නායකතුමා, මගේ කතාවට හොඳින් සවන්දුන් අතර, 'ඔයා ඇයි එහෙම සිතුවේ? ඒ වෙලාවේ ඔයාට මොනවගේ හැඟීමක්ද දැනුණේ?' යැයි අසමින් මගේ කතාවේ පිටුපස ඇති සිතුවිලි තේරුම් ගැනීමට උත්සහ කලා. ඒ තුලින්, හෝසා වටයකදී දුක් වේදනාවකින් සිටින සාමාජිකයින්ට අවධානය යොමු කිරීම සහ ඔවුන්ගේ හැඟීම් හොඳින් තේරුම් ගැනීම වෙනුවෙන් හොඳ ඇහුම්කන්දෙන්නෙකු වීම වැදගත් බව මම වටහා ගත්තා. එනිසා ඉදිරියට හෝසා නායකයෙකු ලෙස කටයුතු කලත් පෙර කියූ හැඟීමට පීඩනයකට පත් නොවේවී යැයි මම සිතනවා. 'හෝසා වටය යනු රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ජීවයයි' යැයි පවසන ලෙසටම හෝසා පුහුණුව තුලින් ධර්ම මිතුරන් සමග එක්ව එකට ඉගෙන ගනිමින් තම හදවත ඔපමට්ටම් කරගනිමින්, දුකට පත් සාමාජිකයින්ට වචනයකින් හෝ ශක්තියක් විය හැකි ඔවුනට මනසේ සාමය උදකරගැනීමට රුකුලක් විය හැකි ජීවිතයට බලාපොරොතුවක් දියහැකි පුද්ගලයෙකු වීමට අධිෂ්ඨාන කරනවා.

බුදුන් වහන්සේගේ ඉගැන්වීම් තුලින් ඔබේ හදවතේ කැටයම් වී තිබෙන්නේ මොනවාද?

බුදුන් වහන්සේගේ ධර්මය තුලින් හේතු ඵල දහම වඩාත්ම සිත්ගත් ධර්ම කරුණ වනවා. මෙය හදවතේ තබාගෙන 'සියලූම ඉගැන්වීම් ආරම්භ වන්නේ හමුවීමකින්' යැයි මම විශ්වාස කරන අතර, දිනපතා හමුවීම් සහ සිදුවීම් වැදගත් කොට සලකමින් කටයුතු කරනවා. එදිනෙද ජීවිතයේ සෑම හමුවීමක්ම ජීවත් වීමට පාඩමක් යැයි සිතමින් මනුෂ්‍යකු ලෙස වර්ධනය වීමට, සතුට භුක්තිවිදීමට හැකියි මම විශ්වාස කරනවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ අපූර්වත්වය ගැන ඔබ සිතන්නේ කෙසේද?

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ ඉගැන්වීම් හොදින් ප්‍ර ායෝගිකව පුහුණු කරන්නේ නම්, දුකින් මිදීමටත් සතුට ලගා කරගැනීමටත් හැකිය යන්න විශිෂ්ඨයි කියා මම සිතනවා. උදහරණයක් ලෙස 'තමන් වෙනස් වුවහොත් අන් අය වෙනස් වනවා' යනුවෙන් උගන්වා ඇති ආකාරයටම ධර්මය ටිකෙන් ටික ප්‍රායෝගිකව පුහුණු කරන්නේනම්, තමාව වෙනස්වන අතර, 'අන් අයත් වෙනස්වේ, තමා වටා පරිසරය වෙනස්වේ' යැයි මම සිතනවා. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට මම සම්බන්ධ වීමට හේතුව මගේ දරුවන් හොද දරුවන් ලෙස පෝෂණය කිරීමේ ආශාවයි. පසුව මම නිවස තුල ධර්ම පුහුණුව ප්‍රගුණ කරන විට දරු දෙදෙනාම කරුණාවන්ත යහපත් තරුණයන් බවට පත් වූ අතර, මම ඒ ගැන හදවතින්ම කෘතවේදී වනවා. කලක් නිවසේ ඇතිවූ ආර්ථික ගැටලු හේතුවෙන් පවුලේ අසමගිය නිසාවෙන් දික්කසාද වීමට තීරණය කලත්, මේ වන විට, ඉගැන්වීම් වලට ස්තූතිවන්නට මගේ මහත්තයා දැන් ධර්ම ශාඛාවේ වැඩිහිටි කණ්ඩායමේ නායක ලෙස කටයුතු කරනවා. දෙදෙනාටම එක්ව ධර්ම පුහුණුවේ යෙදෙන්න හැකිවී තිබෙන අතර සතුටින් කෘතවේදී වනවා.

අවසාන වශයෙන් ඔබගේ බලාපොරොත්තු සහ ධර්ම පුහුණුවේඅ අනාගත් ඉලක්කය කුමක්ද?

ලී සාන් එක්වරක් මට මෙසේ පැවසූවා, 'මෙම ඉගැන්වීම් ඔබගේ දිරිමත්කරන්නා දෙස ගෙන කැපවීමෙන් ධර්මය ප්‍ර ායෝගිකව පුහුණු කරන්නේනම්, ප්‍රීතිමත් සැදෑසමයක් උදවේ'. දැන් මම මහළු වියට පැමිණ සිටින අතර, එද ඇසූ එම වදන් සියැසින් දැක ගැනීමට හැකිව තිබෙනවා. එය ජීවිතයේ අපූර්ව කාල පරිච්චේදයක් යැයි මම සිතනවා. දිගුකලක් ධර්ම පුහුණුවේ යෙදුණු ධර්ම ශාඛාවේ ජේෂ්ඨ ධර්ම නායකයින් දෙස බලන විට අභ්‍යන්තරය දීප්තියෙන් බබලන ඔවුන් ප්‍රීතියෙන් වයසට ගොස් ඇති ආකාරය පෙනෙනවා. ආත්මාර්ථකාමී නොවී ඕනෑම වෙනසක් පිළිගතහැකි නම්‍යශීලී හදවතකින් උපරිම කැපවීමෙන් ජීවත් වනවා. මේ විශිෂ්ඨ වූ ජේෂ්ඨ චරිත ආදර්ශයට ගෙන ඉදිරියටත් ධර්ම පුහුණුවේ යෙදීමට අධිෂ්ඨාන කරනවා. විශේෂයෙන් බුදුන් වහන්සේගේ ධර්මය පුහුණු කිරීමෙන් මම ලබාගත් සතුට ලබාගැනීමට හැකිතරම් පිරිසකට මග පෙන්වීමට කැපවනවා.

නැගෙනහිර ආසියානු පුහුණු වැඩසටහනින් අනතුරුව සහභාගී වූවන් සමග (වම් පස සිට දෙවැනියා)
2025 අවුරුද්දේ අගෝස්තු මස 05 වන දින

බුදුන් වහන්සේගේ කෘතවේදීත්වයට ගෞරව දැක්වීම

ධර්මය කියාදීම හොඳම මාර්ගය වේ

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

බුදුන් වහන්සේට ගෞරව කිරීම සඳහා අප කල යුත්තේ කුමක්ද?

එය නම් 'දානය' වේ. 'දානය' තුලත් වැදගත්ම වන 'ධර්ම දානය' යි. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය බොහෝ මිනිසුන්ට බෙදා දී, ඔවුන්ට ඒ ධර්මය හොඳින් අවබෝධ කරගැනීමට සහ බුදු මගට පිවිසීමට මග පෙන්වීම වේ.

විවිධාර්ත සූත්‍රයේ සඳහන් වන්නේ, 'බෝධිසත්ව හදවතක් නොමැති අය තුළ බෝධිසත්ව හදවත උද්දීපනය කරනවා' යන්නයි. 'බෝධිසත්ව හදවත' යනු, තමා බුදුන් වහන්සේ සරණ යනවා සේම, අනෙකුත් මනුෂ්‍යයන්ටද ධර්මය උගන්වා මග පෙන්වීමට බලාපොරොත්තු වන සිතකි. එය, තමා බෝධිසත්වයන් කෙනෙකු ලෙසින් අවබෝධ කර ගැනීමද වේ.

නමුත්, ශාක්‍යමුනි බුදුන් වහන්සේ දේශනා කල ධර්මස්කන්දය අසුහාර දාහක් සේ ඉතා විශාල වේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයද ඒ අතරින් ඉතා වැදගත් වන අතරම, බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනය ගැනද අන්තර්ගත වේ. උපාය කෞශල්‍ය පරිච්ඡේදය තුල, 'ධර්මය අසන කෙනෙකු ඇතොත්, බුදුබව නොලබන්නාවූ කෙනෙකු නොමැත' සේ සඳහන්ව ඇති පරිදි සැම සියළුදෙනාගේම දෑස් විවර කරමින්, නියම සතුට වෙතට මාඟපාදනවා වේ.

එම නිසා එක් අයෙකුට හෝ වැඩියෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කියාදීම බුදුන් වහන්සේට කරන්නාවූ උතුම්ම ගෞරව මාර්ගය බව ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කල හැක. වර්තමානයේ මිනිස් සංහතිය තුල ඇතිවී තිබෙන විශාලතම ගැටලුව නම් පාරිසරික බලපෑම වේ. එම ගැටළුව නිරාකරනය නොකරගන්නේ නම්, පරිසරය මෙන්ම මනුෂ්‍ය සංහතියම විනාශවීම වැඩි ඇතක නොවේ. විශේෂයෙන්ම, සංවර්ධිත රටවල මිනිසුන්ගේ 'ආශාව' අඩු කරගත යුතුය. භෞතික සම්පත් වල අලංකාරත්වය, සුවදායි බව හා සැප පහසුවට ජීවිතය ගත කල යුතු 'ආශාව' නිසා වර්තමානයේ මෙලෙස පාරිසරික ප්‍රශ්න බිහිවී ඇත.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ඒ ගැන පැහැදිලිවම සඳහන් වී ඇත. උපමා කතාවක් තුල, 'සියළු දුඛ්‍යන්ට මුලික හේතුව ආශාවයි. ආශාව නැතිකර නොගන්නේ නම්, පැවැත්මක් නොමැත' සේ අන්තර්ගතය. එසේම, සමන්ත්‍රභද්‍ර බෝධිසත්වයන්ගේ ධෛර්යය තුල සද්ධර් ම පුණ්ඩරීක සූත්‍ර ය ලබා ගන්නා පුද්ගලයන්, 'ඇති දෙයින් සෑහීමකට පත්ව, සමන්ත භද්‍ර බෝධිසත්ව මාර්ගය පුහුණුවේ යෙදෙන්නේය' සේද සඳහන්ව ඇත.

මෙම 'ආශාව අඩුකර ගැනීම' හා 'ඇති දෙයින් සෑහීමකට පත්වීම' මේ ලෝකය පරිසර හානියෙන් හා මනුෂ්‍ය සංහතිය විනාශ වීමෙන් බේරාගත හැකි වැදගත්ම සාධකයක් වේ.

එසේ ගත්කල සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මනුෂ්‍ය සංහතිය සතුට වෙතට මඟ පෙන්වන ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශයකි. එය ප්‍රචලිත කිරීම, බුදුන් වහන්සේට කළහැකි උපරිම ගෞරවය වේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ පවරා දීම පරිච්ඡේදයේ සඳහන් වන්නේ, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සත්‍ය ධර්මය දේශනා කරමින් සිටින පුද්ගලයන්ව 'දැන්ටමත් බුදුන් වහන්සේගේ ගෞරවයට පාත්‍ර වී ඇති බවයි'.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 86 - 88 පිටු ඇසුරිණි

Director’s Column

වෙහෙස නොබලා ධර්ම ව්‍යාප්තියේ යෙදෙමු

කෙයිඉචි අකගාවා මහතා
රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානය

සියළුදෙනාම හොඳින් සිටිනවාද. ඉතා වේගයෙන් මේ වසරත් ගෙවී ගිහින් නොවැම්බර් මාසයත් උදාවුනා. කෝසෙයි කායි සංවිධානයේ වසර නිමා වෙන්නේ නොවැම්බර් මාසයෙනි. මේ වසරේ නිච්කෝ සෙන්සෙයි විසින්, ‘නැවුම් වූ වසරක්’ යන මාතෘකාව යටතේයි අපට ධර්ම පණිවුඩය ලබා දුන්නේ. මේ වසරේ මොනවගේ කටයුතුද ඔබ සියලුදෙනාට කිරීමට හැකිවුවේ.

එසේම, මේ නොවැම්බර් මාසයේදී ‘බෙදීම හා සාමය’ යන මාතෘකාව යටතේයි නිච්කෝ සෙන්සෙයිගෙන් මාසික පණිවුඩය ලැබුනේ. අපගේ එදිනෙද ජීවිතය හා අප ජීවත් වන සමාජය, එමෙන්ම රට හා ලෝකය දෙසට දෑස් විවර කර බලමු. එවිට අපට දකින්නට හැකි වන්නේ නොයෙක් රටවල් හා කලාපයන් තමන්ගේ නොයෙකුත් අවශ්‍යතා හා මතවාද මත අවසානයක් නොපෙනෙන යුධ ගැටුම් කරන ආකාරය, අසමගිය නිසා වේදනා විඳින විශාල මිනිසුන් පිරිසක් හා හැලූ කඳුලු වේදී යන්නටත් මත්තෙන් නොකඩවා දුක් වේදනාවන්ට පත්ව සිටින මිනිසුන් පිරිසක්වයි.

නිච්කෝ සෙන්සෙයි විසින් ‘ලොව පුරා සිටින ලෝක නායකයන්ට, අප මේ ලෝකයට බිහිවූ ආශ්චර්ය ගැන කරුණු පැහැදිලි කරන්නේ නම්, ‘මේ යුධ ගැටුම් කරන වෙලාවක් නොවෙයි’ යැයි සිතනා නායකයින්ද සිටිය හැකි’ ලෙස පවසා තිබුනා. ගැටුම් හා බෙදීම් පසෙකලා, සමගිය ඇති කරන බුදුන් වහන්සේ දේශනා කල ධර්මයට අනුව, සාමකාමී ලොවක් ගොඩනැගෙනු ඇතැයි බලපොරොත්තු පලකලා.

ධර්ම ව්‍යාප්තිය සඳහා කැපවන අපි එකිනෙකා, මෙම සත්‍ය, හේතුපල වාදය, අනිත්‍ය, අනාත්ම යන බුදුන් වහන්සේ දේශනා කල සත්‍ය අදාල තැන් වලට බද්ධ කර ගනිමින්, ඉදිරියටත් වෙහෙස නොබලා, හමුවන සෑම පුද්ගලයෙකු වෙතටම සිත යොමු කරමින්, සතුට හා සමගිය පිරි මාවතක ගමන් කරමු.

නිර්මාතෘ තුමාගේ ගුණානුස්මරණ උත්සවයකට සහභාගී වූ
ඇමෙරිකාවේ, හවායි ධර්ම ශාඛාවේ සාමාජිකයන් සමඟ සිටින අකගාවා මහතා
2025 ඔක්තොම්බර් මස 04 වන දින, දයිසෙයිදෝවේදී

A Global Buddhist Movement



Information about local Dharma centers

facebook

X

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp